# 17 සැමට සුබසෙත

ශු. මතෙව් 8:1-4, ශු. මාක් 7:31-37

මනුෂ්‍යයාට පූර්ණ විමුක්තිය සලසා දීම ජේසුස් වහන්සේගේ මෙහෙවරෙහි පදනම විය. ඒ උදෙසා දේව රාජ්‍යය හඳුන්වා දෙන අතර ම එය උරුම කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා යොමු කිරීම උන්වහන්සේ විසින් සිදු කරන ලදි.

ලාදුරු රෝගියා හා ගොළු බිහිරි තැනැත්තා සුවපත් කිරීමේ සිද්ධිවලින් අප අත්දකින්නේ ඔවුනට ශාරීරික ව ලබා දුන් සුවය මෙන් ම එය ඉක්මවා ගිය දේව පණිවුඩ ඒ තුළ ගැබ් වන බව ය. මෙම පාඩමෙන් අපි ඒ අත්දැකීම ලබමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. මතෙව් 8.1-4**

ජේසුස් වහන්සේ ජීවත් වූ ජුදෙව් සමාජය තුළ විවිධ හේතූන් මත සමහර ජන කොටස් නොපිළිගැනීමටත් කොන් කිරීමටත් ලක් වී සිටියහ. එලෙස කොන් වූවන් අතර ලාදුරු රෝගීන් කැපී පෙනන ජන කණ්ඩායමක් විය. කුමන හේතුවක් නිසා හෝ යම් ජන කොටසක් සමාජයෙන් කොන් කිරීමට ලක් වන කළ ඔවුන් මානසිකවත් ශාරීරිකවත් පීඩා විඳින බව නො අනුමාන ය. නොයෙකුත් පීඩාවන්ගෙන් අසහනයට පත් ජනතාව අතර වූ විවිධ රෝගාබාධයන්ගෙන් පීඩා විඳි ජනතාවට ජේසුස් වහන්සේ සුවය ලබා දී සහනය සැලසූ සේක. ජේසුස් වහන්සේ වෙත පැමිණි රෝගීන් සුවය ලැබීම උදෙසා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම වැදගත් කරුණක් විය. ඒ බව ඔවුන් සුවය ලැබීම පිණිස ජේසුස් වහන්සේගෙන් කළ ඉල්ලීම්වලින් වඩාත් පැහැදිලි වෙයි.

එලෙස විශ්වාසයෙන් යුතු ව සුවය අයැද සිටි ලාදුරු රෝගියා පිළිබඳව කරුණු විමසා බලමු.

එකල ලාදුරු රෝගියෙක් උන්වහන්සේ වෙත අවුත්, වැඳවැටී,

*"ස්වාමිනි ඔබ කැමති සේක් නම්, මා පවිත්‍ර කරන්න ඔබට පුළුවනැ"යි කීය. උන්වහන්සේ අත දිගු කොට, ඔහු පිට තබා "මම කැමැත්තෙමි පවිත්‍ර වන්නැ" යි වදාළ සේක. එකෙණෙහි ම ඔහුගේ ලාදුරු රෝගය සුව විය. ජේසුස් වහන්සේ කතා කොට "මේ ගැන කිසිවෙකුට කිසිවක් නොකියන ලෙසට වගබලා ගන්න; එහෙත් යන්න, පූජකයාට පෙනී, මෝසෙස් අණ කළ පඬුර සහතිකයන් පිණිස ඔප්පු කරන්නැ"යි ඔහුට වදාළ සේක.*

*ශුද්ධ වූ මතෙව් 8 : 2-4*

"මා පවිත්‍ර කරන්න ඔබට පුළුවනැ"යි ලාදුරු රෝගියා කළ ඉල්ලීම තුළ ජේසුස් වහන්සේ කෙරෙහි ඔහු තුළ තිබූ ගැඹුරු විශ්වාසය හා ඇදහිල්ල ගැබ් ව ඇත. තමාට සුවවීම සඳහා ජේසුස් වහන්සේගේ කැමැත්ත ප්‍රමාණවත් බව පැවසුවේ එබැවිනි.

ජුදෙව් සමාජය විසින් කොන් කරන ලද ලාදුරු රෝගය වැලඳුණු මිනිස්සු ශාරීරික ව මෙන්ම මානසික ව ද, පීඩා වින්දහ. පළමු ව ඔවුන් ලාදුරු රෝගය නිසා විඳින පීඩාව යි. දෙවනුව ලාදුරු රෝගීන් ව සිටින හෙයින් අපවිත්‍ර වූවන් ලෙස සලකා සමාජයෙන් කොන් කිරීම නිසා විඳින පීඩාව යි. සුවය නොව පවිත්‍ර කරන ලෙස ඔහු ජේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටියේ එහෙයිනි.

යම් තැනැත්තෙකු ලාදුරු රෝගියකු ස්පර්ශ කළ හොත් එම තැනැත්තා ද අපවිත්‍ර වන බව ජුදෙව්වන්ගේ පිළිගැනීම විය. එසේ තිබිය දී ජේසුස් වහන්සේ තම අත දිගු කොට ලාදුරු රෝගියා පිට අත තබා (ස්පර්ශ කොට) ඔහුට සුවය ලබා දුන් සේක. එලෙස රෝගීන් සම්බන්ධයෙන් එකල ජුදෙව් සමාජය පවත්වාගෙන ගිය, ජනතාව පීඩනයට පත්කළ වත්පිළිවෙත් ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව ක්‍රියාවෙන් ම පෙන්වා දුන් සේක. උන්වහන්සේගේ දයානුකම්පාවෙන් පිරුණු සිත මෙයින් පැහැදිලි වෙයි. කිසිවෙක් කිසි දිනක ලාදුරු රෝගියකු ස්පර්ශ නොකරති. එහෙත් ජේසුස් වහන්සේ එසේ කිරීමෙන් උන්වහන්සේ මනුෂ්‍යයින් වෙත දක්වූ දයාව මනා ව පිළිබිඹු කළ සේක.

ජේසුස් වහන්සේ ලාදුරු රෝගියාට සුවය ලබා දීමෙන් අනතුරුව "මේ ගැන කිසිවෙකුට නොකියන ලෙස වග බලා ගන්න" යි පැවසූ සේක. ඒ උන්වහන්සේට හාස්කම් මගින් ජනතාව තමන් වෙතට හරවා ගැනීමට අවශ්‍ය නොවූ නිසා ය. එහෙත් උන්වහන්සේ ලාදුරු රෝගියාට "පවිත්‍ර" බව ලබා දී ඔහු නැවත සමාජයේ පිළිගැනීමට ලක් කිරීමට හා ඉන් ඔහුගේ ජීවිතයට සහනයක් ලබා දීමට කටයුතු කළ සේක. තව ද මෙහි දි ජේසුස් වහන්සේ "පූජකයාට පෙනී මෝසෙස් අණ කල පඬුර සහතිකයක් පිණිස ඔප්පු කරන්න" යනුවෙන් ඔහුට පවසමින් ජුදා සමාජ නීතියට එකඟ ව කටයුතු කිරීමට මෙන් ම පවිත්‍ර වීමේ නීත්‍යානුකූල භාවය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ලබන්නට සැලැස්වූ සේක. මන්ද රෝගීන් අපවිත්‍ර පිරිසක් ලෙස සැලකූ ජුදෙව්වන් ඔවුන් සුව වී නම් නැවත පවිත්‍ර වීමේ ලකුණක් ලෙස මෝසෙස් අණ කළ පඬුර ඔප්පු කර පූජකයාගේ සහතිකය ලැබීමට අවශ්‍ය වූ හෙයිනි.

මෙලෙස ජේසුස් වහන්සේ ජනතාවට අවශ්‍ය ශාරීරික මෙන් ම මානසික සුවය ද ලබා දෙමින් ඔවුන්ගේ ජීවිතවලට සහනය සලසා දුන් සේක.

**විමසුමට**

**ශු. බයිබලයෙන්**

**ශු. මාක් 7:31-37**

***එකල සෙනඟ වික්කල් බිහිරෙකු උන්වහන්සේ වෙත ගෙන්වුත් ඔහු පිට අත තබන ලෙස උන්වහන්සේගෙන් උදක් ම ඉල්ලූහ.***

*ශු. මාක් 7 : 32*

ගොළු බිහිරි තැනැත්තෙකුට තම අවශ්‍යතා පිළිබඳ ව කිසිවෙකු හා ප්‍රකාශ කිරීමට නොහැක. මන්ද ඔහුට යමෙකු පවසන දේ නොඇසෙන්නා සේ ම තම අවශ්‍යතාව තවත් කෙනෙකුට ප්‍රකාශ කිරීමට ද නොහැකි හෙයිනි.

එවන් රෝගියෙකුට සහනය සැලසීම වෙනුවෙන් මෙහි දී සෙනඟ ඉදිරිපත් වූහ. ජේසුස් වහන්සේ වෙතට මේ තැනැත්තා රැගෙන ආවේ සෙනඟ ය. මෙහි දී සෙනඟ "හඬක්" නොමැති අසරණ අයකුගේ "හඬ" බවට පත් විය. මෙම සිද්ධිය තුළ රෝගියාට සුවය ලැබීමට අවස්ථාව උදා වූයේ සෙනඟගේ ඇදහිල්ල නිසා ය. ගොළු බිහිරි පුද්ගලයාට සුවය පතා කළ ඉල්ලීමට ජේසුස් වහන්සේ ප්‍රතිචාර දැක්වූ සේක. සුවය දානය කළ සේක.

මෙම සිද්ධියේ දී ජේසුස් වහන්සේ සුවය දීම පිණිස ඔහු ජනතාවගෙන් ඉවත රැගෙන ගිය බව සඳහන් වෙයි.

ජේසුස් වහන්සේගේ සමීපත්වය හා ස්පර්ශය අත් දුටු ගොළු බිහිරි තැනැත්තා ඔහු පැතූ සුවය ලැබී ය. ජේසුස් වහන්සේ ඔහු සුව කළ සේක.

මෙහි දී රෝගියා සුව කිරීමට ජේසුස් වහන්සේ රෝගියාගේ කන්වල ඇඟිලි බහාලීමත්, දිව ස්පර්ශ කිරීමත් වැදගත් ය. මන්ද රෝගීන් ස්පර්ශ කිරීම අපවිත්‍ර වීමක් ලෙස එකල ජුදෙව් සමාජයේ පිළිගැනීම විය. ජේසුස් වහන්සේ නැවත

වරක් එම සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කරමින් පීඩිත ජනතාවට සමීප වී ඔවුනට සහනය සැලසූ සේක.

තව ද ස්වර්ගය දෙස බලා "එප්පාතා" ("ඇරේවා") යනුවෙන් වදාරමින් රෝගියා සුව කිරීමට "වචනයේ බලවත්කම" පෑ සේක. උන්වහන්සේ දිව්‍යමය වෛද්‍ය-වරයාණන් බව මින් සනාථ වෙයි.

මෙලෙස ලාදුරු රෝගියාට මෙන් ම ගොළු බිහිරි තැනැත්තාටත් සුවය ලබා දීමට උන්වහන්සේ "වචනය" මෙන් ම "ක්‍රියාව" යොදා ගත් සේක.

ජේසුස් වහන්සේ ලාදුරු රෝගියාට මෙන් ම ගොළු බිහිරි තැනැත්තාට ද වදාළේ මෙම හාස්කම් කිසිවකුටත් නොකියන ලෙස ය. එහෙත් ජේසුස් වහන්සේගේ මෙම ක්‍රියා නිසා උන්වහන්සේ මහිමයට පත් විය. නමුත් උන්වහන්සේට අවශ්‍ය වූයේ මිනිසාගේ අවශ්‍යතා ඉදිරියේ ඔවුනට සහනය සැලැස්වීම පමණි.

මෙලෙස අපගේ ජීවිත ගැටලු හමුවේ ජේසුස් වහන්සේගේ සහනය පතා සාමූහිකවත්, පෞද්ගලිකවත් අපි යාච්ඤා කරමු; උන්වහන්සේගේ සරණ හා ශක්තිය අයැදිමු; අන් අයගේ සුබසෙත උදෙසා ක්‍රියා කරමු; එමෙන් ම හඬක් නැඟීමට නොහැකි අය වෙනුවෙන් විශේෂයෙන් මැදිහත් වෙමින් ඔවුන්ගේ අවශ්‍යතා ජේසුස් වහන්සේගේ පාද පාමුල තබමු. එවිට ජේසුස් වහන්සේගේ සමීපත්වය පෞද්ගලික ව ද සාමූහික ව ද අප එක් එක්කෙනාට අත්දැකිය හැකි වනු ඇත. උන්වහන්සේ විසින් අපට දෙනු ලබන සහනය පිළිබඳ ව සාක්ෂි දැරීම සාමූහික ව මෙන් ම පෞද්ගලික ව ද ඉටු කරමු.

**ක්‍රියාකාරකම**

1. ජේසුස් වහන්සේ තුළින් සුවය අත්දුටු බයිබලයේ සඳහන් තවත් පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.
2. ඔබගේ මිතුරෙකු හෝ මිතුරියක රෝහල්ගත ව සිටින අවස්ථාවක
   - ඇයට/ඔහුට සුවය පතා
   - වෛද්‍ය, හෙදි, සාත්තු සේවක සේවිකාවන්ට මඟපෙන්වීම පතා
   - ඔවුන්ගේ දෙමාපියන්ට සහනය පතා යැදුමක් නිර්මාණය කරන්න.